2013 මාර්තු 28

අධ්‍යක්ෂ ජනරාල් තුමා
ශ්‍රී ලංකාවේ මහජන උපයෝගිතා කොමිෂන් සභාව
6 වන මහල, ලංකා බැංකු මර්චන්ට් ගොඩනැගිල්ල
සාන්ත මයිකල් පාර, කොළඹ 3

## *විදුලිබල ගාස්තු පිළිබඳ මහජන අදහස් විමසුම -2013*

1. ආසියා පැසිපික් කලාපයේ රටවල් රැසක යටිතල් පහසුකම් ප්‍රතිපත්ති සම්බන්ධයෙන් පර්යේෂණ කටයුතු සිදුකරන ආයතනයක් වන ලර්න්ඒෂියා ආයතනය ශ්‍රී ලංකාව මූලස්ථානය කරගෙන කටයුතු කරයි. නියාමන කටයුතු සම්බන්ධයෙන් වන සිය 2013 ප්‍රධාන පාඨමාලාව මෙහෙයවන මෙන් යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණ පිළිබඳ දකුණු ආසියානු සංගමයේ (SAFIR) ලේකම් කාර්යාලය විසින් පසුගිය මාර්තු මාසයේදී ලර්න්ඒෂියා ආයතනයට ආරාධනය කරනු ලැබිනි. අපේ කලාපයේ බොහෝ රටවල විදුලිබල නියාමකයෝ මේ සමුළුවට සහභාගි වූහ. ඒ හැරුණුවිට, ජංගම දුරකතන සහ විදුලිබල යන ක්ෂේත්‍රවලදී පාරිභෝගික සබඳතා වඩා හොඳින් පවත්වාගත හැක්කේ කෙසේදැයි යන කරුණ සම්බන්ධයෙන් ද ලර්න්ඒෂියා ආයතනය බංගලාදේශය, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව යන රටවල පර්යේෂණ කටයුතු සිදුකරයි. 2013 මාර්තු 13 වනදා දාතමින් සහ අංක TE/TARIFF/CONS/2013 යොමු අංකයෙන් යුතුව යෝජිත විදුලිබල ගාස්තු සම්බන්ධයෙන් අදහස් විමසමින් ඔබ ආයතනය විසින් යොමුකර තිබූ ලිපියට ප්‍රතිචාර වශයෙන්මෙම අදහස් දැක්වීම ඉදිරිපත්කිරීම ලර්න්ඒෂියා ආයතනයේ අපේක්ෂාවයි. විශේෂිත මාතෘකා 3 කට අදාලව අදහස් දක්වන මෙන් ඔබේ ලිපියෙන් ඉල්ලා තිබූ අතර එයට අනුකූලව පහත අදහස් දක්වා සිටිමු.
2. එමෙන්ම 2013, අප්‍රේල් මස 04 වන දින සිදුකිරීමට නියමිත මහජන අදහස් විමසීමේ අවස්ථාවට ද සහභාගිවීමට බලාපොරොත්තු වෙමු. මෙම අවස්ථාවේදී වාචිකව අදහස් දැක්වීමක් අපගෙන් අපේක්ෂා කරන්නේ නම් ඒ සඳහා එදින පෙරවරුවේ කාලයක් වෙන්කර දෙන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමි. **මේ ඉල්ලීම කරනු ලබන්නේ ඉන්දියාවේ පාඨමාලාවක ඉගැන්වීම කටයුතු සඳහා එදින පස්වරුවේ දී මා දිවයිනෙන් බැහැරවයාමට නියමිත හෙයිනි.**

**<u>1 වන මාතෘකාව: විදුලිබලය සැපයීමේ ගාස්තු තවදුරටත් අඩුකිරීමේ ක්‍රමවේදයන් තිබේද?</u>**

3. **ඉල්ලුම පහතහෙළීම පිණිස ක්ෂණික ක්‍රියාමාර්ග ගැනීම:** දවසේ උපරිම ඉල්ලුම පවතින කාලයේදී සැපයුම්කිරීම සඳහා ඩීසල් වැනි අධි-මිල ඉන්ධනයන් යොදාගනිමින් විදුලිබල ජනනයකිරීම සඳහා අධික පිරිවැයක් දැරීමට සිදුවේ. විදුලිබල ජනනය, අඩු පිරිවැය ක්‍රමවේදයන්හි සිට ක්‍රමයෙන් වැඩි පිරිවැය ක්‍රමවේදයන් කරා ක්‍රමයෙන් ගමන්කරන්නේය යන උපකල්පනය මත පිහිටා අප විසින් ගණනය කිරීම් කරන ලදී. එහිදී පෙනීගියේ 2011 වර්ෂයේදී විදුලිබල මණ්ඩලය විසින් මිලදී ගත් උපරිම-මිල බලශක්තිය සියයට 5 ක ප්‍රමාණයට බලශක්ති මිලදීගැනීම් සඳහා යෙදවූ සමස්ත පිරිවැයෙන් සියයට 17 ක් වැයවී ඇති බවයි. මේ පිරිවැය, මණ්ඩලය විසින් මිලදීගත් අවම-මිල බලශක්තිය ප්‍රමාණයෙන් සියයට 50 ක් මිලදී ගැනීම සඳහා වැයකරන ලද ප්‍රමාණයට සමානය. මේ අනුව බලනවිට, බලශක්තිය මිලදීගැනීම සියයට 5 කින් අඩුකිරීමට හැකියාවක් ඇත්නම් ලංකා විදුලිබල මණ්ඩලයේ පාඩුව අවමකර ගතහැක. මෙයින් පැහැදිලිවන්නේ ඉල්ලුම කලමනාකරනය කිරීමේ වැදගත්කමයි. සියළු විදුලිබල ඉල්ලුම් සම්පූර්ණයෙන්ම අඩුකිරීමක් අවශ්‍ය නොවන අතර පරිභෝජනය, උපරිම ඉල්ලුම කාල පරිච්ඡේදයේ සිට අවම ඉල්ලුම කාල පරිච්ඡේද දක්වා මාරුකර ගැනීමට හැකිනම් සැලකියයුතු තරමේ සහනයක් උදාකර ගතහැකි වනු ඇත (උදාහරණයක් ලෙස, ප්‍රධාන වශයෙන් ගල්අඟුරු යොදාගනිමින් අඩුමිල විදුලිබලය ජනනය කරන රාත්‍රි යාමය දක්වා ඉල්ලුම මාරුකිරීම). සාමාන්‍යයෙන් දවසේ උපරිම ඉල්ලුම පවතින කාලය තුල පවතින ඉල්ලුම අඩුකර ගතහැකි නම් විදුලිබලය සැපයීමේදී දරන්නට සිදුවන සමස්ත පිරිවැය පහත හෙළාගත හැකිවනු ඇත.
4. එබැවින්, උපරිම ඉල්ලුම කාලසීමාවේ දී ඉල්ලුම සීමාකිරීම පිණිස දිරිගැන්වීම් නිර්මාණය කෙරෙන ගාස්තු ව්‍යුහයක් යොදගැනීම කෙරෙහි ක්ෂණික අවධානය යොමු කළයුතුය.

a) ඒකක 30, 60, 90 වැනි එක් එක් පරිභෝජන මට්ටම්වලදී ඒකක මිල වැඩිකිරීම විදුලි පාරිභෝගිකයින් තුල එක්වරම විශාල කම්පනයක් ඇතිකිරීමට හේතුවනු ඇති අතර සිය පරිභෝජනය පහතහෙළාගැනීම පිණිස ස්වේච්ඡාවෙන්ම පියවර ගැනීමට ඔවුන්ගෙන් කිසියම් ප්‍රතිශතයකට පෙළඹවීම් කරනු ඇතත් එපමණක්ම නොසෑහේ.

b) ඉල්ලුම තවදුරටත් පහත හෙළාගැනීම පිණිස 'දැන් උපරිම ඉල්ලුම් කාලය එළැඹී ඇතැයි' පාරිභෝගිකයින්ට සිහිගැන්වීමේ ව්‍යාපාරයක් දියත්කිරීම සඳහා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් විදුලිබල මණ්ඩලයට නියම කළයුතුය. මේ සඳහා රූපවාහිනී, ගුවන් විදුලි සහ ජංගම දුරකතන කෙටි පණිවිඩ වැනි මාර්ග යොදා ගතහැක. මේ විශේෂිත කාලය තුලදී ඉල්ලුම වඩා පලදායී ලෙස අඩුකර ගතහැක්කේ කවර වර්ගයේ විදුලි උපකරණ පාවිච්චිකිරීමෙන් වැලකී සිටීමෙන්දැයි ජනතාව දැනුවත්කිරීම ද මෙවැනි ව්‍යාපාරයක් හරහා සිදු කළහැක.

c) විදුලි පාරිභෝගිකයින් තුල සාධනීය චර්යාමය වෙනස්වීමක් සිදුකළහැකි තවත් ආකාරයක් නම් ඔවුන්ගේ විදුලිබිල (එනම්, විදුලිබල පරිභෝජනය) ඔවුන් වැනිම වූ/වෙනත් ගෘහස්තයන් සමග සැසඳීමට සැලැස්වීමයි. අධික පරිභෝජනයක් ඇති ගෘහස්තයන්ට විශේෂිතවූ පණිවිඩයක් ලබාදීමේ ක්‍රමයක් මෙහිදී අනුගමනය කළහැක. ඔවුන් වැනි අනෙකුත් ගෘහස්තයන්ට වඩා රුපියල් X ප්‍රමාණයක් ඔවුන් විදුලිය සඳහා ගෙවන බවට පණිවිඩයක් එම ගෘහස්තයන්ගේ විදුලිබිල් මත මුද්‍රණය කිරීම බොහෝ රටවලදී හොඳ ප්‍රතිපල අත්කරදී තිබේ.[1] වැඩි විස්තර ලබාදෙන නව බිල්පතක් සැලසුම්කිරීම අත්‍යවශ්‍ය බව පෙනේ.

d) ගාස්තු ව්‍යුහයේ විප්ලවීය වෙනසක්කිරීම කර ඇති නිසා පරිභෝජන මට්ටම් පිළිබඳ උපකල්පන සාවද්‍ය වීමට ඉඩ ඇත. මෙහිදී ප්‍රක්ෂේපණය කර ඇති ප්‍රමාණයට වඩා ඉල්ලුම පහළ මට්ටමකට වැටේ නම් යෝජිත ගාස්තු ව්‍යුහය විසින් අතිරික්ත ආදායම් ලබාදීමට ඉඩ තිබේ. එහෙයින්, ආදායම් මට්ටම් අධීක්ෂණය කිරීමට මෙන්ම අතිරික්තයන් නැවත පාරිභෝගිකයන් වෙත ගෙවීමට හැකිවන වගන්ති ගාස්තු සංශෝධන සමග ඇතුලත් කළයුතුය.

5. **සැපයුම වෙනස්කිරීම සඳහා කෙටිකාලීනව (වසරක් ඇතුලත) සිදුකලහැකි ක්‍රියාකාරකම්:** විදුලිය ජනනය කිරීම පිණිස අධික පිරිවැයක් දැරීමට සිදුවීමේ එක් ප්‍රධානහේතුවක් වනුයේ ඒ සඳහා අධි-මිල ඉන්ධන (විශේෂයෙන්ම ඩීසල්) යොදාගැනීම සහ අකාර්යක්ෂම ජනන යන්ත්‍ර පාවිච්චි කිරීමයි. එහෙයින් යෝජිත නොරච්චෝලෙයි දෙවන අදියර, ප්‍රකාශ කර ඇති අයුරින්ම 2014 දී ජාතික පද්ධතියට සම්බන්ධකිරීම අතිශයින් වැදගත්ය. මෙම උත්පාදනාගාරයෙන් විදුලිය නිපදවීම නිසා විශාල මුදලක් ඉතිරිකර ගතහැකිවේයයි ඇස්තමේන්තුකර තිබේ. මෙසේ ඉතිරිවන මුදලින් සාධාරණ කොටසක් විදුලිබල මණ්ඩලයේ පවතින දැවැන්ත ණය පියවීමට දායකකර ඉතිරි කොටස ප්‍රතිදානයන් වශයෙන් නැවත පාරිභෝගිකයින් වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය. ඒ අතර, විදුලි ගාස්තු, නිෂ්පාදන පිරිවැයට සැසඳෙන තත්වයට ගෙනඒමේ ප්‍රතිපත්තිය පවත්වා ගෙනයායුතුය.

6. **සැපයුම වෙනස්කිරීම සඳහා වඩා දිගුකාලීන (වසර 2 හෝ ඊට වැඩි) ක්‍රියාකාරකම්:** දුරස්ත මනුකියවීම, දවසේ එක් එක් කාලය සඳහා වෙනස් ගාස්තු අයකිරීම සහ තවත් දේ අඩංගු, කවර ආකාරයක හෝ නව මනුක්‍රමයක් (smart metering) සහ පෙරගෙවුම් මනු ක්‍රමයක් නොමැතිව හරවත් ඉල්ලුම් කලමනාකරනයක් සිදුකිරීම උගහටය. මෙහිදී ප්‍රාග්ධන වැය මෙන්ම අවශ්‍ය උපකරණ මිලදී ගැනීමේ ක්‍රියාවලියක් සිදුකිරීම අවශ්‍යවනු ඇත. එබැවින්, මේ ක්‍රියාමාර්ගය අදියර වශයෙන් ක්‍රියාත්මක කිරීම සුදුසුය.

   a) උදාහරණයක් ලෙස, අළුතින් ඉදිවන සහාධිපත්‍ය (condominium) නිවාසවලට ස්මාට් මීටර් සවිකිරීම විදුලිබල මණ්ඩලයට/ LECO සමාගමට වහාම අනිවාර්යය කළයුතුය. වර්තමානයේදී වැඩි විදුලි පරිභෝජනයක් පවතින ගෘහස්තයන්ගෙන් අවම වශයෙන් සියයට 50 කටවත් ස්මාට් මීටර් සවිකිරීමට විදුලිය බෙදාහරින ආයතනයට අනිවාර්යකිරීම ඊළඟ පියවර වියයුතු අතර එය ඉදිරි වසර 2 හෝ 3 ඇතුලත ලෙස සිදුකල යුතුය (ඒකක 180ට වැඩියෙන් විදුලිය පරිභෝජනය කරන ගෘහස්තයන් මේ ගණයට අයත් කළහැක). පාරිභෝගිකයින්ගේ පරිභෝජන රටාවන් වෙනස් කළහැකි සියුම් එහෙත් නවීන වැඩසටහන් දියත්කිරීමට මෙවැනි මනු ක්‍රම හරහා හැකියාව ලැබේ. ඊටත් වඩා වැදගත් කරුණ නම්, මෙවැනි මනු ක්‍රම හරහා දවසේ එක් එක්

[1] සේවා සපයන්නන් විසින් ඉදිරිපත් කරනු ලබන සැලසුම් තෝරාගැනීම් සහ ඔවුන් විසින් උපායශීලීව පාරිභෝගිකයින් වෙත තොරතුරු ඉදිරිපත්කිරීම තුලින් සාධනීය චර්යාත්මක වෙනස්කම් වෙනස්කම් (බලශක්තිය වඩා කාර්යක්ෂමව භාවිතකිරීමට පාරිභෝගිකයින් තුල සිදුකෙරෙන චර්යාත්මක වෙනස්කම් වැනි) සිදුකළහැකි බව නවතම විෂය ක්ෂේත්‍රයක් වන චර්යාත්මක ආර්ථික විද්‍යාවේ කරන ලද පර්යේෂණවලින් පෙනීගොස් ඇත.

කාලය සඳහා වෙනස් ගාස්තු අයකිරීම සහ පිරිවැය පිළිබිඹුකරන ගාස්තු අයකිරීම වැනි වඩා නවීන ප්‍රතිපත්තිමය විසඳුම් අනාගතයේදී ක්‍රියාත්මක කිරීමට හැකිවනු ඇත ( වැඩි විස්තර සඳහා මීළඟ කොටස කියවන්න).

b) වැයකිරීමේ හැකියාව අඩු පිරිස් සඳහා, දූරකතන අංශය ආදර්ශයට ගනිමින් පෙර ගෙවුම් සබඳතා සහ කුඩා මුදල් ප්‍රමාණවලින් යළි-ආරෝපණය (re-load) කිරීමේ ක්‍රමයක් යොදා ගතහැකිය. පෙරගෙවුම් සහ ප්‍රති-ආරෝපණ ජාලයන් ඇතිකිරීම පිණිස ප්‍රාග්ධනයක් යෙදවීමට සිදුවෙතත් එමගින් විදුලිබල මණ්ඩලයට සහ LECO ආයතනයට ගෙවීම් පැහැරහැරීමේ අවදානමින් මිදීමට හැකිවනු ඇතුවා පමණක් නොව මාසික බිල් ලබාදීමේ වියදමද පහතවැටෙනු ඇත. මෙවැනි පෙර ගෙවුම් සබඳතා පද්ධතියක් සවිකිරීමේ පිරිවැය සහ ප්‍රතිලාභ සොයාබැලීම පිණිස අධ්‍යයනයක් සිදුකළ යුතුය. මෙහිදී සමස්ත පද්ධතියේම පිරිවැය සහ ප්‍රතිලාභ සැලකිල්ලට ගතයුතුය.

7. උපරිම ඉල්ලුම පවතින කාල පරිච්ඡේදයෙන් පසුව රාත්‍රියේ පසුභාගයේදී ඉල්ලුම බෙහෙවින් පහළ බසින බව පෙනේ. මේ කාලයේදී එක් ජනන මූලාශ්‍රයකින් සියයට 20 ක් පමණක් ලබාගනිමින් සැපයුම සිදුකෙරේ. මේ තත්වය නිසා සාමාන්‍යයෙන් ගල් අඟුරු බලාගාරයකින් ලැබෙන කාර්යක්ෂමතාවයට වඩා අඩු කාර්යක්ෂමතාවයක් නොරච්චෝලේ බලාගාරයෙන් ලැබෙන බව පෙනේ. ඉදිරියේදී තවත් විශාල තාප බලාගාර ඉදිවීමත් සමගම මේ ගැටළුව වඩා උග්‍රවනු ඇත. එබැවින්, පහත දැක්වෙන ක්‍රියාමාර්ගයන්ගෙන් එකක් හෝ කිහිපයක් යොදාගැනීම පිණිස කොමිෂන් සභාව විසින් කාලය නියමකල සැලසුම් සැකසීමට ලංකා විදුලිබල මණ්ඩලයට නියෝගකිරීම උචිත වනු ඇත.

a) ඉන්දියානු විදුලි සැපයුම් ජාලය සමග ශ්‍රී ලාංකික ජාලය සම්බන්ධකරවන කේබලයක් ඉදිකිරීම
b) සියයට 20 නීතියේ අදාලභාවය පිළිබඳව යළි තක්සේරු කරබැලීම <u>**හෝ**</u>
c) දිරිගැන්වීම් ලබාදීම හරහා රාත්‍රියේ අවම ඉල්ලුම කාලය තුල විදුලි පරිභෝජනය ඉහළ නැංවීම හෝ නිපදවෙන අතිරේක විදුලිය ජලය ආපසු ජලාශ කරා පොම්පකිරීම සඳහා යොදාගැනීම. එවිට උපරිම ඉල්ලුම කාලය තුල ජල විදුලිය නිෂ්පාදනය කිරීම සඳහා මේ ජලය යොදාගත හැකිවනු ඇත. ස්වභාවයෙන්ම අනාවැකි පලකල නොහැකි සහ වරින් වර පමණක් ලැබෙන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් විසින් මිනියහැකි තරමේ විදුලිබලයක් නිපදවන හෙයින් (2011 වර්ෂයේදී මෙය සමස්ත විදුලිබල නිපයුමෙන් සියයට 6 ක් විය) මෙසේ ආපසු පොම්ප කර රැස්කරනු ලබන ජලය විදුලි ජනන මිශ්‍රණයට වටිනා එකතුවක් වනු ඇත.

**මාතෘකාව 2 : පිරිවැය නැවත ආපසු අයකරගනිමින් රටේ ආර්ථික සංවර්ධනය සඳහා මගපෙන්වන විකල්ප ගාස්තු ව්‍යුහයක්**

8. ඉතාමත්ම යෝග්‍ය හෙවත් ප්‍රශස්ත ගාස්තු ව්‍යුහය වනු ඇත්තේ සෑම ඉලෙක්ට්‍රෝනයකටම එකම මිලක් අය කරන එකකි. නමුත්, විවිධ පාරිභෝගික පන්තීන් සඳහා ද උපරිම සහ අවම ඉල්ලුම කාලසීමා තුලදී ද ඉලෙක්ට්‍රෝන සැපයීම පිණිස දැරීමට සිදුවන පිරිවැය විවිධය. එහෙයින් පැහැදිලිව වෙනස්කොට ගතහැකි විවිධ පාරිභෝගික පන්තීන්ගෙන් විවිධ මිල අයකරගැනීමේ අවශ්‍යතාවයක් ඇත. නමුත්, විවිධ පාරිභෝගික පන්තීන් අතර මෙවැනි පරස්පරයන් පවත්වාගෙන යෑම ප්‍රවේශමෙන් කලයුතුය. මන්ද, මෙවැනි තත්ව බොහෝවිට සුළු පරිමාණ දූෂණවලට මගපාදන හෙයිනි. උදාහරණයක් ලෙස, ඒකක 60 සහ 90 අතර වන මිල වෙනසින් වාසි ලබාගැනීම පිණිස එකම නිවසට මනු කිහිපයක් සවිකරවාගැනීම සහ මනුවේ කියවීම අවුල්කිරීම සඳහා විවිධ උපක්‍රම යෙදීම දැක්විය හැක. මෙම මූලධර්මය ජාතික බලශක්ති ප්‍රතිපත්තියේ කොටසක් (ඡේදය 3.5) වන අතර එය ක්‍රියාත්මක කිරීමට මහජන උපයෝගිතා කොමිෂන් සභාව බැඳී සිටී.[2]

a) පිරිවැය පිළිබිඹුකරන ගාස්තු ගෙවීමට නොහැකි කොට්ඨාශයක් ගෘහස්ත විදුලි පාරිභෝගිකයින් අතර සිටීමට ඉඩ තිබේ. මේ ගැටළුවට විසඳුම් ලබාදියහැක්කේ කෙසේදැයි ප්‍රශ්න අංක 3 යටතේ සාකච්ඡා කෙරේ.

9. පිරිවැය පිළිබිඹුවන ගාස්තු අයකිරීමේ ක්‍රියාමාර්ගයට ක්ෂණිකවම අවතීර්ණ විය නොහැක. නමුත්, මේ අරමුණ ඉටුකරගැනීම කරා වසරින් වසර ක්‍රමානුකූලව ගමන් කළයුතුය. ඒකක කලාප සංඛ්‍යාව සහ ඒ ඒ

2 http://www.ceb.lk/download/db/national_energy_policy.pdf

කලාප අතර ඒකක මිල වෙනස තවදුරටත් අඩුකල යුතු බව මේ වසරේ ගාස්තු තීරණයකිරීමත් සමගම නියෝග කල යුතුය. සමහරවිට, මේ වසරේදීම කලාප හා ප්‍රභේද සංඛ්‍යාව අඩුකිරීම සුදුසුයැයි කොමිෂන් සභාව තීරණය කිරීමට ඉඩ තිබේ.

10. පරිභෝජනය ගණනය කරන කාලසීමාව සම්බන්ධයෙන් පැහැදිලි අර්ථදැක්වීමක් නව ගාස්තු ව්‍යුහය තුලින් ලබාදීම අවශ්‍යය (උදා. මසකට ඒකක 90). දැනට එය දක්වා ඇති අන්දම අපැහැදිලිය (මසක් ලෙස සැලකෙන්නේ දින 30 ක් ද 31 ක් ද? පෙබරවාරි මාසය ගැන කෙසේද?). මනු කියවන්නා ගේ පැමිණීම වේලාසන හෝ පමාවී සිදුවුවහොත් තත්වය කුමක්ද? මෙහිදී යොදාගතහැකි එක් විසඳුමක් නම් මනු කියවන්නා පැමිණෙන දිනට පෙරදින සිට පිටුපසට දින 30 ක පාරිභෝජනයේ සාමාන්‍ය සොයා ඒ අනුව ඒකක ගාස්තුව නිර්ණයකිරීමයි.

11. විදුලිගාස්තු, එයට වැයවන පිරිවැය පිළිබිඹු කලයුතුයැයි කියවෙන ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ උපායමාර්ග ක්‍රියාත්මක කරනවිට උපරිම ඉල්ලුම කාලසීමාවේ ගාස්තු සහ එයින් පිටත කාලසීමාවේ ගාස්තු එකිනෙකින් වෙනස්වීම අනිවාර්යයෙන්ම සිදුකළයුතු වන්නේ ඒ කාලසීමාවන් දෙකෙහි විදුලි උත්පාදන පිරිවැය එකිනෙකට වෙනස්වන හෙයිනි. මේ සඳහා වෙනස් කාලපරිච්ඡේදයනට වෙනස් ගාස්තු අදාලකිරීමේ හැකියාව ඇති මනු යොදාගැනීම සහ ක්‍රියාත්මක කළහැකි ප්‍රතිපෝෂණ විදුලි පාරිභෝගිකයනට ලබාදියහැකි යාන්ත්‍රණයන් ද අවශ්‍යය.

a) සියළුම පාරිභෝගිකයන්ගේ පරිශ්‍රයන් තුල ස්මාට් මනු සවිකිරීම සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයන එක්කෝ මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් සිදුකළයුතු අතර එසේත් නැත්නම් ඒ සඳහා ලංකා විදුලිබල මණ්ඩලය යොමුකළ යුතුය. අධිකව විදුලිය පරිභෝජනය කරන්නන් උදෙසා එවන් අධ්‍යයනයක එතරම් අවශ්‍යතාවයක් නොමැති අතර නියමකරන ලද කාලසීමාවක් තුල, විශේෂයෙන්ම ඊළඟ ගාස්තු සංශෝධනයට පෙර, ඔවුන්ගේ පරිශ්‍රවල ස්මාට් මනු සවිකිරීම අනිවාර්ය කළයුතුය. දවසේ එක් එක් කාලයට විවිධ ගාස්තු අයකිරීම ඊළඟ වසරේදීවත් සිදුකළහැක්කේ ස්මාට් මනු සවිකිරීම නිමකළහොත් පමණකි.

**මාතෘකාව 3: විදුලි/බලශක්ති සහනාධාර ලබාදීම සඳහා සලකාබැලීම අවශ්‍යවන විවිධ සමාජ-ආර්ථික කණ්ඩායම් සොයාගැනීම**

12. දැනට, රටේ ගෘහස්තයන් මිලියන 3.6 ක් පමණ මසකට විදුලි ඒකක 90 කට අඩුවෙන් පරිභෝජනය කරන අතර එමනිසා සිය විදුලි බිලට අදාලව සැලකියයුතු සහනාධාරයක් ලබති. මේ සහනාධාරය (මුදල් වටිනාකම අතින් පෙරට වඩා අඩු වුවත්) යෝජිත ගාස්තු ව්‍යුහය තුලින් තවදුරටත් පවත්වාගනු ඇත. අඩුවෙන් පරිභෝජනය කරන පාරිභෝගිකයිනට සහනාධාර ලබාදීම වෙනුවට රජය කළයුත්තේ අඩු ආදායම්ලාභී ගෘහස්තයනට සහනාධාර ලබාදීමය. සැබෑ දිළිඳු ජනකොටස් හඳුනාගැනීමේ කටයුත්තේදී සියයට සියයක් සාර්ථක නැතත් දිළිඳු ජනතාව සඳහා ශ්‍රී ලංකාවේ පවතින එකම 'ආරක්ෂක දැල' සමෘද්ධි[3] වැඩසටහනයි. මිලියන 1.5 කට අධික ගෘහස්ත සංඛ්‍යාවක් මාසිකව සමෘද්ධි දීමනාව ලබති.

a) මෙම ගෘහස්තයනට සහනාධාර ලබාදීම අවශ්‍යය. මෙය බලශක්ති වවුචර ආකාරයෙන් හෝ මුදල් ඔවුන්ගේ බැංකු ගිණුමට මාරුකිරීම තුලින් සිදුකළහැක. මෙම මුදල්, වැඩිකළ විදුලි ගාස්තු ගෙවීම පිණිස පාවිච්චි කළහැකි වේ. සිය බලශක්ති පරිභෝජනය අඩුකරගැනීමට සමෘද්ධි ගෘහස්තයක් තීරණය කළහොත් එසේ ඉතිරි කරගන්නා මුදල් වෙනත් භාණ්ඩ හෝ සේවා මිලදීගැනීම පිණිස යොදාගැනීමේ අවස්ථාව තිබේ. දැනටමත් සාමාජිකත්වයේ ගිණුම්වලට මුදල් මාරුකිරීම සමෘද්ධි ව්‍යාපාරය විසින් සිදුකරනු ලබන හෙයින් සහනාධාර ඉලක්කකිරීමේ මේ ක්‍රමය ඉක්මනින් ක්‍රියාවේ යෙදීමට හැකියාව තිබේ. පහළ ආදායම් ලබන පවුල් සඳහා මේ ආකාරයෙන් බලශක්ති සහනාධාර ලබාදීම සංවර්ධිත රටවල සුලභ වශයෙන් දක්නට ලැබේ. [4]

b) මහජන උපයෝගිතා කොමිෂන් සභාව සහ ප්‍රැක්ටිකල් ඇක්ෂන්[5] ආයතනය පවසන අන්දමට මසකට විදුලි ඒකක 50 කට අඩුවෙන් පරිභෝජනය කරන ගෘහස්තයෝ 'බලශක්ති දරිද්‍රතාවයෙන් පෙළෙති (එනම් ප්‍රමාණවත් තරමට බලශක්තිය පරිභෝජනය නොකරති). දිළිඳු (එනම් සමෘද්ධි) ගෘහස්තයන් මෙම

---

[3] උදාහරණයක් ලෙස, ලෝක බැංකුව සහ ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (IPS) ආයතන විසින් දක්වා ඇත්තේ සමෘද්ධි වැඩසටහන විසින් දිළිඳු ජනතාව හඳුනාගැනීමේ ක්‍රමයේ ගැටළු පවතින බවයි (උදාහරණයක් ලෙස, ව්‍යාපාරයේ සාමාජිකත්වය අන්ත දුගී ජනතාවට වඩා ඉහලින් සිටින දුගී ජනතාවගෙන් සැදී ඇති බවයි). විස්තර සඳහා
http://www.ips.lk/talkingeconomics/2010/07/better-targeting-of-transfers-samurdhi-programme/ and
http://siteresources.worldbank.org/INTDECINEQ/Resources/SamurdhiJune042003.pdf

[4] උදාහරණ වශයෙන් Low Income Home Energy Assistance Program (LIHEAP) හි මෙහෙයුම් පහත වෙබ් අඩවිය තුලින් කියවන්න
http://www.acf.hhs.gov/programs/ocs/programs/liheap/about

[5] ශ්‍රී ලංකාවේ ප්‍රැක්ටිකල් ඇක්ෂන් ආයතනය විසින් ඉදිරිපත් කර ඇති 'Level of energy poverty in Sri Lanka' සහ http://www.sa-energy.net/m/ENERGY.pdf; and Ranasinghe, A. (2011), Study on Requirements of Prospective Electricityල කියවන්න

බලශක්ති-දරිද්‍රතා කඩඉමේ සිටින්නේයැයි අප උපකල්පනය කළහොත් දැන් පවතින ගාස්තු අනුව ඔවුන්ගේ මාසික බිල රුපියල් 308 ක් වන අතර යෝජිත ගාස්තු ව්‍යුහය යටතේ එය රුපියල් 408 දක්වා ඉහළ යනු ඇත (ඔවුන්ගේ විදුලි පරිභෝජනය නියත ඒකක 50 ක රැඳී තිබේ යන උපකල්පනය යටතේ). ඔවුනට වැඩිවන මුදල දල වශයෙන් රුපියල්150 ක් වන අතර මෙය සහනාධාරයක් ලෙස ගෙවිය හැකිය. අප ඇස්තමේන්තු කරන ආකාරයට ඒ සඳහා රජයට වැයවනු ඇති මුදල රුපියල් බිලියන 2.7 කි. මේ සංඛ්‍යාව විශාල ලෙස පෙනුනත් එය 2012 වර්ෂයේදී විදුලිබල මණ්ඩලය ගොඩගැනීම පිණිස රජය විසින් යෙදුවේ යැයි ඇස්තමේන්තුගත මුදලවන රුපියල් බිලියන 59 න් සියයට 5 කටත් වඩා අඩු මුදලකි. [6]

13. ‘ජාතික බලශක්ති ප්‍රතිපත්ති සහ උපායමාර්ගයෙහි’ පෙන්වා ඇති විධි විධානවලට අනුකූලව විශේෂ ආගමික ගාස්තු ප්‍රභේදය යටතේ සහන ලබාදීමට ඉඩකඩ නැත. කෙසේවෙතත්, දැනට මේ අංශය යටතේ ගාස්තු සහන ලබන ආගමික ආයතනවලට බුද්ධශාසන සහ ආගමික කටයුතු අමාත්‍යාංශයේ වැය ශීර්ෂය තුලින් බලශක්ති සහනාධාරයක් ලබාදීමෙහි වරදක් නැත. මෙවන් සහනාධාරයක් ඇතිකිරීමට හදිසි වියයුතු නැත්තේ යෝජිත ගාස්තු ක්‍රමය යටතේ ආගමික ස්ථානවල ගාස්තු අඩුවන බැවින් සහ ඒ වෙනුවට අනෙකුත් පාර්ශවවල ගාස්තු වැඩිකරන බැවිනි. ආගමික ස්ථාන සඳහා වන මේ විශේෂිත සහනාධාරය නැවතීමේ උපදෙස් මහජන උපයෝගිතා කොමිෂන් සභාව සිය 2013 ගාස්තු තීරණ ප්‍රකාශයට ඇතුලත් කළයුතුය. එසේම, ඒ වෙනුවට බුද්ධ ශාසන සහ ආගමික කටයුතු අමාත්‍යාංශ වැය ශීර්ෂයෙන් කෙලින්ම එම ආගමික ස්ථානවලට අරමුදල් මාරුකිරීමට ද උපදෙස් දියහැක. එසේත් නැතහොත් එම මුදල් පිරිවැයට වඩා අඩුවෙන් විදුලිය සැපයීම නිසා ලංකා විදුලිබල මණ්ඩලය සහ LECO ආයතනවල සිදුවන පාඩුව නැතිකරගැනීම පිණිස එම ආයතනවලට ගෙවීම් කිරීම ද හොඳ අදහසක් වනු ඇත.

ස්තුතියි,
මීට විශ්වාසී,

ආචාර්ය රොහාන් සමරජීව
සභාපති, ලර්න්ඒෂියා

[6] ශ්‍රී ලංකා රජය ( 2012), මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව, 2011, පිටුව 158